# ග්‍රාමීය සමාජයීය ආර්ථිකයට ඇඟළුම් ක්ෂේත්‍රයෙන් ලැබෙන දායකත්වය පිළිබඳ විමසීමක්.

**ඩී. එස්. ආර්. හේමචන්ද්‍ර**[1]

**සංක්ෂේපය**

මෙම පර්යේෂණයේ මූලික අරමුණ වූයේ, ග්‍රාමීය ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය සඳහා රෙදිපිළි ඇඟළුම් කර්මාන්තය මගින් ලැබුණු දායකත්වය හා එම කර්මාන්තය මුහුණපාන අනාගත අභියෝගය අධ්‍යයනය කිරීමයි. අධ්‍යයන ප්‍රදේශය ලෙස මෙහි දී තෝරා ගනු ලැබුවේ රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ මැතිවරණ කොට්ඨාසයයි. ප්‍රාදේශීය කාර්මීකරණ වැඩපිළිවෙළ යටතේ මැලිබන්, රෙඩ්හාට් වශයෙන් ඇඟළුම් කර්මාන්ත දෙකක් මෙම අධ්‍යයන ප්‍රදේශය තුළ පිහිටුවා ඇති අතර මෙම කර්මාන්ත ශාලා දෙකම නියෝජනය වන පරිදි සේවක සේවිකාවන් 60 කින් යුතු නියැදියක් තෝරා ගැනුණි. තොරතුරු ලබා ගැනීම සඳහා ප්‍රශ්නාවලියක් යොදා ගත් අතර ප්‍රශ්නාවලියේ නොමැති එහෙත් අත්‍යවශ්‍ය කරුණු සේවකයින්ගෙන් මෙන් කර්මාන්ත වල කළමනාකරුවන්ගෙන් සම්මුඛ සාකච්ඡා  මගින් ලබා ගැනුණි. ඇඟළුම් කර්මාන්ත හා ඒ ආශ්‍රිත ද්විතික දත්ත ලබා ගැනීමේ දී ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා, පොත්පත්, සඟරා, ලිපි ලේඛන ආදිය භාවිතා කෙරුණි. දත්ත විශ්ලේෂණය සඳහා විස්තරාත්මක ක්‍රමය සහ සංඛ්‍යානමය ක්‍රමවේදයන් භාවිත කළ අතර මෙහිදී සංඛ්‍යා වගු සටහන් මඟින් ඉදිරිපත් කරන ලද දත්ත තවදුරටත් පැහැදිලි කිරීම සඳහා ප්‍රස්තාර සටහන් යොදා ගැනුණි. විචල්‍යයන් දෙකක ස්වායත්තතාවය පරීක්ෂා කිරිම සඳහා කයි වර්ග පරීක්ෂාව යොදා ගත් අතර ඇඟළුම් සේවකයින් සේවයෙන් ඉවත් වීමට හේතු පැහැදිලි කිරීමට හරිත මධ්‍යන්‍ය සංකල්පය භාවිතා කෙරුණි. මෙහි දී විචල්‍යයන් ලෙස ඇඟළුම් සේවක සංඛ්‍යාව, ආදායම, වියදම් කළ අයිතමයන්,රැකියා අහිමි වීමට බලපෑ හේතු ලෙස ඇඟළුම් සේවක සේවිකාවන් දක්වන කරුණු යොදා ගැනේ. පවතින සීමාවන් හැකිතරම් අවම වන පරිදි ලබා ගත් තොරතුරු භාවිතයෙන් පර්යේෂණය සිදු කරන ලදි. ප්‍රදේශීය මට්ටමින් බිහි වූ ඇඟළුම් කර්මාන්තවල සේවය සඳහා ග්‍රාමීය තරුණ තරුණියන්ට අවස්ථාව සැලසුන අතර විරැකියාවෙන් පෙළුණු තරුණ තරුණියන්ට රැකියා අවස්ථා ලැබුණි.ග්‍රාමීය පිහිටවනු ලැබූ ඇඟළුම් කර්මාන්ත හේතුවෙන්  දුෂ්කර ප්‍රදේශවලින් වෙළෙඳ කලාප වලට ඇදුණු ග්‍රාමීය තරුණ තරුණියන්ගේ ප්‍රමාණය සංඛ්‍යාත්මකව අඩු වූ අතර එයින් යහපත් සමාජීය හා ආර්ථික බලපෑම් ඇති විය. එනම් ඔවුන්ගේ නිවෙස්වලින් ඈත්වීමෙන් සිදු වන අයහපත් බලපෑම් අඩු වීම මෙන්ම තම ප්‍රදේශවලම සේවය කිරීමට අවස්ථාව සැලසීම නිසා ඔවුන්ට වැඩිපුර මුදල් ඉතිරි කිරීමට ද හැකියාව ලැබී ඇත. වර්තමාන ආර්ථික අවපාතය හමුවේ ඇඟළුම් කර්මාන්ත වැසී ගියහොත් ග්‍රාමීය ජනතාවට  මුහුණ දීමට සිදුවන ගැටලු හා රජය ඒ සඳහා යොදා ගන්නා විකල්ප සංවර්ධන ක්‍රියාවලිය කුමක් ද යන්න තක්සේරු කිරීමට ද මෙම අධ්‍යයනය වැදගත් වේ.

**මුඛ්‍ය පද :** ඇඟළුම් කර්මාන්තය, සංවර්ධන ක්‍රියාවලිය, ග්‍රාමීය ජනතාව

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, rajinishakila@gmail.com